# POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES

## UNIVERSITY OF KELANIYA

## REGISTRATION FOR POSTGRADUATE STUDIES

### Academic Year - 2016

**The Institute invites applications for the following one year courses of study, which are due to commence in February, 2016. Following Courses will be conducted in English (classes on three weekday afternoons) and Sinhala (classes on Saturdays) medium.**

**Applications will be entertained for the Master of Philosophy (M.Phil) and Doctor of Philosophy in Buddhist Studies (Ph.D) research degree programmes throughout the year.**

**01.** **Postgraduate Diploma in Buddhist Studies (1 year)**

***Minimum Entry Qualifications:***

A Degree from a recognized University or a pass at the final examination of the Oriental Studies Society (Sri Lanka).

Course fee (for local students) - Rs 18,000.00*****

**02.** **Master of Arts (M.A.) Degree in Buddhist Studies (1 year)**

***Minimum Entry Qualifications:***

1 A Degree specializing in any one of the following subjects: Buddhist Philosophy, Buddhist Culture, Philosophy, Psychology, Pali, Sanskrit, Sinhala, or a General Degree with any one of the above subjects except Sinhala. **or**

2 An honours Degree or Postgraduate Diploma in Buddhist Studies from the Buddhist and Pali University of Sri Lanka. **or**

3 Postgraduate Diploma in Buddhist Studies of this Institute or a pass at the final examination of the Buddhist Studies conducted by the Sri Lanka Bhikshu University at Anuradhapura or a pass at the final examination of the Oriental Studies Society. (Sri Lanka)

Course fee (for local students) - Rs 20,000.00*****

## 03. Postgraduate Diploma in Pāli ** (1 year)

***Minimum Entry Qualifications:***

Those who have a first Degree from any recognized University in any subject / subjects are eligible to apply for this course provided that they fulfill one of the following requirements.

01. Final certificate of Vidyodaya or Vidyalankara Pirivena.
02. A pass in First Examination of Oriental Studies Society (Sri Lanka) or a credit pass for Pali at the G.C.E (O/L) Examination.
03. A pass in Pali subject at the M.A. in Buddhist Studies examination conducted by this Institute.
04. A pass in Pali at the Bauddha Dharmacharya Examination.
05. Any other qualification acceptable to the Faculty Board of the Institute.

Course fee (for local students) - Rs 18,000.00*

## 04. Master of Arts (M.A.) Degree in Pali ** (1 year)

***Minimum Entry Qualifications:***

One of the following requirements is necessary for admission:

01. A special Degree with Pali as a subject
02. A General Degree with Pali as a subject or as a subsidiary Subject in the Special Degree.
03. A pass at the final examination of the Oriental Studies Society (Sri Lanka)
04. A pass at the Postgraduate Diploma in Pali conducted by the PGIPBS
05. Any other qualification acceptable to the Faculty Board of the Institute.

Course fee (for local students) - Rs 20,000.00*

## 05. Postgraduate Diploma in Buddhist Ayurvedic Counselling

***Minimum Entry Qualifications:***

One of the following requirements is necessary for admission:

01. A Special or General Degree in any subject/subjects from a recognized University.
02. Diploma in Ayurveda Shasthri with five (05) years' training in the relevant field.
03. Any other qualification acceptable to the Faculty Board of the Institute/University of Kelaniya.

Course fee (for local students) - Rs 50,000.00*

(Sinhala medium only)

## 06. Master of Arts Degree in Buddhist Ayurvedic Counselling

***Minimum Entry Qualifications:***

One of the following requirements is necessary for admission:

01. A pass in the Examination of Diploma in Buddhist Ayurvadic Counselling Course conducted by this Institute.
02. Any other qualification acceptable to the Faculty Board of the Institute/University of Kelaniya. ***(additional qualifications list is available at the office )***

(Sinhala medium only)

Course fee (for local students) - Rs 75,000.00*

*Course fee could be settled in 3 installments and a registration fee of Rs. 1500/-, Library fee of Rs. 1000/-, Refundable Library Deposit of Rs. 1500/- and Examination fee of Rs. 2500/- also must be paid.

***Please refer to the website advertisement for the fees applicable for foreign students.***

(** subject to the condition of minimum no. of students registered)

Duly completed applications for one year courses should be addressed to Assistant Registrar to reach the following address.

**Assistant Registrar, Postgraduate Institute of Pali and Buddhist Studies, No: 113, Dutugemunu Street, Kohuwala.**

**Applications will be entertained for the following two research degree programmes throughout the year**

## 07. Master of Philosophy in Buddhist Studies (M.Phil)

**(2 Years)**

## 08. Doctor of Philosophy in Buddhist Studies (Ph.D)

**(3 Years)**

***Minimum Entry Qualifications for above 07 and 08:***

- A First or second class (Upper Division) in an honours or Special Bachelor's Degree from a recognized University in one of the following areas of study. Buddhist Philosophy, Buddhist Culture, Pali, Sanskrit, Philosophy, or any other subject related to these areas of studies.
- Masters Degree from a recognized University in an appropriate area of study.
- Any other qualification / qualifications deemed as equivalent to the above by the Faculty Board of the Institute and the University Senate.

Applicants who are having above qualifications will be initially registered for M.Phil and may be upgraded to a Ph.D for those who have satisfactorily completed at least 50 % of the study within 18 months' period with the approval of the Faculty Board of this Institute.

The application forms are available at the office of this Institute at following costs. MA/Postgraduate Diploma Rs. 500/= , M.Phil /PhD - Rs 1000/=
Application forms can also be requested by post by sending the Deposit Slip after paying relevant amount to Peoples Bank - Thimbirigasyaya Branch's Account No : 086-100181189664 together with a self-addressed (9" x 4" size) stamped envelope.

**Prof. Kotapitiye Rahula Thero**
**Director**

WEB : http://www.kln.ac.lk/institutes/pgipbs
Telephone: 0112809321 / 0113051085/ 0112809322

| FOR FOREIGN STUDENTS | FEES (per year) | PG Diploma in Pali /Buddhist Studies | Master of Arts in Pali /Buddhist Studies | Master of Philosophy ( M Phil ) | Doctor of Philosophy (PhD) | FOREIGN STUDENTS (Other fees payable) |
|---|---|---|---|---|---|---|
| *members of the* ***Buddhist clergy*** | Course Fee+ Examination Fee | **US$ 600** | **US$ 700** | **US$ 950** | **US$1050** | + <br>• Registration Fee Rs 1500 /= (per year)<br>• Library Fee Rs 1000/= (per year)<br>& refundable library deposit Rs.1500(MA/PGD) Rs. 3000/= (for research degrees) |
| *students from* ***SAARC Countries*** | Course Fee+ Examination Fee | **US$ 750** | **US$ 925** | **US$ 1175** | **US$ 1275** | |
| *students from* ***Developed Countries*** | Course Fee+ Examination Fee | **US$ 900** | **US$ 1175** | **US$ 1475** | **US$ 1775** | |
| *students from* ***Other Countries*** | Course Fee+ Examination Fee | **US$ 825** | **US$ 1025** | **US$ 1250** | **US$ 1350** | |

***wdttilakaratne/ar@pgipbs2015***

# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

## පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ලියාපදිංචි කිරීම

2016 අධ්‍යයන වර්ෂය

**මෙම ආයතනය මගින් පහත දැක්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. මෙම පාඨමාලා 2016 පෙබරවාරි මස ආරම්භවීමට නියමිතය. තවද බෞද්ධ අධ්‍යයන දර්ශනපති (M.Phil) සහ දර්ශන විශාරද (Ph.D) පර්යේෂණ උපාධි පාඨමාලා සඳහා කාල නියමයකින් තොරව ඉල්ලුම්පත් භාර ගනු ලැබේ**

සිංහල මාධ්‍යය (සෙනසුරාදා දිනවල) හා ඉංග්‍රීසි මාධ්‍යය (සතියේ දින තුනක් සවස් වරුවේ) යන මාධ්‍ය දෙකෙන්ම පාඨමාලා පැවැත්වේ.

### 01. බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**
පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණය සමත්වීම.
පාඨමාලා ගාස්තු : රු. 18,000.00 *

### 02. බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති (M.A.) උපාධි පාඨමාලාව

**ඇතුළත් වීමේ සුදුසුකම් :**
පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කොට තිබිය යුතුය

01 බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, දර්ශනය, පාලි, මනෝවිද්‍යාව, සංස්කෘත, සිංහල යන විෂයයකින් විශේෂ ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය සමත්වීම හෝ සිංහල හැර ඉහත විෂයයක් සහිතව සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයෙන් සමත්වීම. හෝ

02 ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගෞරව ශාස්ත්‍රවේදී හෝ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්වීම. හෝ

03 මෙම ආයතනයේ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත්වීම හෝ අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම හෝ ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම.

පාඨමාලා ගාස්තු : රු. 20,000.00 *

## 03. පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා ඇති සහ ප්‍රථම උපාධියට අමතරව පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කොට තිබිය යුතුය.

01 විද්‍යෝදය හෝ විද්‍යාලංකාර පිරිවෙන් අවසාන පරීක්ෂණය සමත්වීම.

02 ප්‍රචීන භාෂෝපකාර සමාගමෙහි ප්‍රාරම්භ විභාගය හෝ අ.පො.ස (සා පෙළ) පාලි විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම.

03 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙහි පාලි විෂයයෙන් සමත් වීම.

04 මෙම ආයතනය මගින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාවේ පාලි විෂයය සමත්ව තිබීම.

05 ආයතනයේ පීඨ මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

පාඨමාලා ගාස්තු : රු. 18,000.00 *

## 04. පාලි අධ්‍යයන ශාස්ත්‍රපති (M.A.) උපාධි පාඨමාලාව **

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කොට තිබිය යුතුය

01 පාලි විෂයයෙන් විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය සමත්වීම

02 පාලි විෂය සහිතව සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය සමත්වීම හෝ විශේෂ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා පාලි අනුවිෂයක් ලෙස සමත්වීම.

03 ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණය සමත්වීම.

04 මෙම ආයතනය මගින් පවත්වනු ලබන පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

05 ආයතනයේ පීඨ මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

පාඨමාලා ගාස්තු : රු. 20,000.00 *

## 05. බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කොට තිබිය යුතුය

01.පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයයක් පිළිබඳ සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.

02."ආයුර්වේද ශාස්ත්‍රී" ඩිප්ලෝමාව හා වසර පහකට නොඅඩු ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ පුහුණුවක් ලබා තිබීම.

03.ආයතනයේ පීඨ මණ්ඩලය/කැලණිය විශ්වවිද්‍යාලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

පාඨමාලා ගාස්තු : රු. 50,000.00 *

## 06. බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති (M.A.) උපාධි පාඨමාලාව

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කොට තිබිය යුතුය

01.මෙම ආයතනය මගින් පවත්වන බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වීම.

02.ආයතනයේ පීඨ මණ්ඩලය/කැලණිය විශ්විද්‍යාලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් :

*ඉහත උපාධි පාඨමාලාව සඳහා අමතර සුදුසුකම් පහත දැක්වේ.*

*(1) i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආයුර්වේද උපාධියක්*

සහ

ii. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලැබූ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්
හෝ
(ආ) රජයේ අනුමත කළ, ආයතනයේ පීඨ සභාවට පිළිගත හැකි සහ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අනුමත කරන උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවකින් සමත් වීම.

සහ

iii. ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන බෞද්ධායුර්වේද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවට අයත් මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය (PDBC01) නැමැති ප්‍රශ්න පත්‍රයට පෙනී සිට සමත් වීම.

(2) i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය හෝ පාලි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක්

සහ

ii. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලැබූ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමත් වීම.
හෝ
(ආ) රජයේ අනුමත කළ, ආයතනයේ පීය සභාවට පිළිගත හැකි සහ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අනුමත කරන උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවකින් සමත් වීම.

සහ

iii. ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන බෞද්ධායුර්වේද පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට අයත් මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය විග්‍රහය (PDBC03) නැමැති ප්‍රශ්න පත්‍රයට පෙනී සිට සමත් වීම.

(3) i. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මනෝවිද්‍යාව, උපදේශනය, සමාජවිද්‍යාව හෝ දර්ශනය පිළිබඳ උපාධියක්
**හෝ**
(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් බටහිර වෛද්‍ය විද්‍යා උපාධියක්
**හෝ**
(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිතව, ආයතනයේ පීඨ සභාවට පිළිගත හැකි සහ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අනුමත කරන උපදේශන ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක හෝ පෞද්ගලික ආයතනයක වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් වෘත්තීය උපදේශකයෙකු ලෙස කටයුතු කොට තිබීම.

සහ

ii. ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන, බෞද්ධායුර්වේද පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට අයත් මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය (PDBC01) සහ මනෝකායික ගැටලු පිළිබඳ ආයුර්වේදීය විග්‍රහය (PDBC03) නැමැති ප්‍රශ්න පත්‍ර දෙකට පෙනී සිට සමත් වීම

පාඨමාලා ගාස්තු : රු. 75,000.00 *

* ඉහත සියලු පාඨමාලා ගාස්තු වාරික 03 කින් ගෙවිය හැකි අතර පාඨමාලා සඳහා ලියාපදිංචි ගාස්තු රු.1500, පුස්තකාල ගාස්තු රු.1000, ආපසු ගෙවනු ලබන පුස්තකාල ගාස්තු තැන්පතුව රු.1500 සහ විභාග ගාස්තු රු. 2500 බැගින්ද ගෙවිය යුතු වේ.
(**අදාල පාඨමාලා සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි වී සිටීමට යටත්ව)

අයදුම්පත් ආයතන කාර්යාලයෙන් ලබාගත හැකි අතර පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා අයදුම්පත් සඳහා රුපියල් 500.00 ක් ද දර්ශනපති හා දර්ශන විශාරද උපාධි පාඨමාලා සඳහා රුපියල් 1000.00 ක් ද අයකරනු ලැබේ. අයදුම්පත් තැපැල් මගින් ලබාගන්නේ නම් මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086-100181189664 දරණ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ගිණුමට අදාල මුදල බැර කර අදාල බැරපත හා ලිපිනය ලියූ මුද්දර කවරයක් (9" x 4" ප්‍රමාණයේ) සමඟ සහකාර ලේඛකාධිකාරී නමට විමසන්න.

*අයදුම්පත් ලබාගැනීම හා නැවත යොමුකිරීම*

**සහකාර ලේඛකාධිකාරී,** පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, **අංක: 113, දුටුගැමුණු වීදිය, කොහුවල.**

## පහත සඳහන් පර්යේෂණ උපාධි සඳහා කාල නියමයකින් තොරව ඉල්ලුම්පත් භාර ගනු ලැබේ

## 07. බෞද්ධ අධ්‍යයන දර්ශනපති (M.Phil) උපාධිය

## (වර්ෂ දෙකයි)

## 08. බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (Ph.D) උපාධිය (වර්ෂ තුනයි)

**පර්යේෂණ උපාධි පාඨමාලාවක් සඳහා අයදුම් කරන අපේක්ෂකයනට පහත දැක්වෙන සුදුසුකම් වලින් යටත් පිරිසෙයින් එකක් හෝ තිබිය යුතුයි**

- බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, පාලි, සංස්කෘත, දර්ශනය හෝ බෞද්ධ හා පාලි අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වෙනත් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක විශේෂ ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයෙන් ප්‍රථම හෝ ද්වීතීය (ඉහළ) ශ්‍රේණියක් ලබා සමත්වීම.

- පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයෙන් සමත් වීම.

- ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

ඉහත සුදුසුකම් සහිත සියලු අයදුම්කරුවන් ආරම්භයේදී දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි කරනු ලබන අතර ප්‍රථම ලියාපදිංචි දින සිට වර්ෂ එකහමාරක් තුල අධ්‍යයන කටයුතු 50% සම්පූරණ කර ඇති විටෙක පීඨ සභා අනුමැතිය සහිතව එම අයදුම්කරුවන්ට එම උපාධිය දර්ශන විශාරද උපාධි පර්යේෂණයක් ලෙස උසස් කරගැනීමේ අවස්ථාව ලබා ගතහැකි බව සැලකිය යුතුය.

**මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි**
අධ්‍යක්ෂ

වෙබ් අඩවිය : http://www.kln.ac.lk/institutes/pgipbs
දුරකථන : 0112809321 /0113051085 /0112809322

*wdttilakaratne/ar@pgipbs2015*